


KP ගේ කොලම

# අතුරුදහන් කල සරසවි සම්මානය

පසුගිය අවුරුදු ගානක් පුරා ශ්‍රී ලාංකික සිනමාවේ මහා මංගල්‍යයක් වූ සරසවි සම්මාන උලෙල හා ජනාධිපති සම්මාන උලෙල නතර වී තිබුනා. ලෝකයේ රටවල් දිහා හොඳින් ඇස ගසා සිටින අපිට ඒ ඒ රටවල් දේශීය සිනමාව ලෝක සිනමාවට දක්වන ආදරය හා සැලකිල්ල කොපමණ දැයි තේරුම් ගැනීම අරුමයක් නොවේ.

ළගම රට ඉන්දියාව ඔවුන්ගේ සිනමා කර්මාන්තයට සළකන්නේ දේශීය ආර්ථිකයේ ප්‍රධාන හිමිකරුවකු ලෙසටය. සල්මන් ඛාන් නඩුවෙන් නිදහස් කිරීමද දේශපාලනික ක්‍රියාදාමයක් වන්නට බොහෝ සේ ඉඩ තිබෙන්නට පුලුවන්ය. මන්ද ඔහු අවුරුදු 5කට හිරේ දැම්මොත් ඉන්දියානු සිනමා කර්මාන්තය අවුරුදු 10කට ආපස්සට යෑම වලකා ලන්නට අමාරුය. ඒ තරමට ඔහු හා ඉන්දියානු සමාජගත මිනිසුන් හා බැඳීම ප්‍රබලය. ඉන්දියාවේ මේ මහා ජනගහනයේ අපිරිමිත වූ රසවින්දනාත්මක කාරණාව වන්නේ සිනමාව බව ඉතා පැහැදිලිය.

නමුත් විජය කුමාරතුංගගේ ඔලුවට වෙඩි තබා මරා දමන විට අමන දේශපාලන ගැත්තන්ට මේ විනාශ කරන්නේ ශ්‍රී ලාංකීය සිනමාවේ මහා සලකුණක් බව ඔවුන්ට වැටහෙන්නට තරම් බුද්ධියක් නැතිවන්නට ඇත. ඉන්දියාවට ගොඩවූ තැන සිට අපිට ඉන්දියානු සිනමාවේ අපූරුව ගැන පුදුම හිතෙන්නට පුලුවන. ඔවුන්ගේ ජීවන රටාවන් හා ඔවුන්ගේ මේ මහා කර්මාන්තය අතර ඇත්තේ පරස්පරයකි.

ශ්‍රී ලාංකික අපිට උරුම වී තිබූ සොඳුරු ආනන්දනීය සිංහල සිනමාව ටිකෙන් ටික වියැකී යන්නේ අපි නොදැනුවත්වමය. කාලයක සිට අප විසින් හඩ නගන සිනමා පාසල පිළිබඳව කිසිවකුට කිසිදු හැඟීමක් නැත්තා සේය. ඕපපාතිකව අත තබනු ලබන කිසිදු කර්මාන්තයකට පැවැත්මක් තිබිය නොහැකිය.

ලාංකික දේශපාලනයද තේරුම් ගත යුතු ප්‍රධාන කරුණක් ඇත. අහිංසක සුන්දර ගැමි මිනිසුන්ගේ එකම රසාස්වාදනීය මාධ්‍ය වූ සිනමාව කඩා වැටෙන්නට නොදී තබා ගැනීම රජයකට ඉතා වැදගත් වන්නේ ඒ තුළින් බරපතල දේශපාලනික වාසියක් ද ඇති බව මා විශ්වාස කරන බැවිනි. බොහෝ දුක්ඛ දෝමනස්සයන්ගෙන් පිරි මිනිසුන්ට ලස්සන සිනමා පටයක් රසවිඳින්නට දෙන්නට සැලැස්වීම රජයේ වගකීමකි. එය සුලුපටු කරුණක් නොවන බව මා තරයේ විශ්වාස කරමි.

මේ සියලු කරුණු කාරනා මැද පසුගිය රාජපක්ෂ රජය විසින් සිංහල සිනමාවේ මහා මංගල්‍යයන් දෙකම නතර කර දමන්නේ රංජන් රාමනායකට බයේ බව මාගේ මතයයි. ඔහු ජනප්‍රිය නලුවා වනු දැකීම සිංහල සිනමාව කඩා වැටීමට වඩා ඔවුන්ට බරපතල ඛේදවාචකයකි.කරුණු කාරනා මෙසේ තිබියදී මේ දේශපාලන අරගලයට මුල පුරමින් අප අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතාට ඉදිරිපත් කරනු ලබන යෝජනා 10 අතර ජනාධිපති හා සරසවි සම්මාන උලෙල ආරම්භ කිරීමට යන යෝජනාවද ප්‍රමුඛ කරුණක් විය.

සතුටක් දැනෙන්නේ නැවතත් මේ අවුරුදදේ මාර්තු මාසයේ සරසවි සම්මාන උලෙල පවත්වන්නට දැන් සියල්ල සූදානමින් පවතින බැවිනි. දැන්නම් ඒවා වෙනුවෙන් පෙනී සිටින්නට බොහෝ දෙනා සිටින වග ඉතා පැහැදිලිය.

මේ දේශපාලනික පෙරලියට ටික දිනකට පෙර සරසවියේ කතෘ අරුණ ගුණරත්න හමු වූ අවස්ථාවේ මේ සැරේ කෙසේ හෝ සරසවි සම්මාන උලෙල අපි කරන්නට අවශ්‍ය වටපිටාව සූදානම් කර ගමු යැයි මා ඔහු සමග කිව්වාය. එවිට ඔහුද කීවේ ඒකට කොහොමහරි පොට පාදා ගනින් මචං, මට ඉන්න වේද දන්නේ නෑ ඒත් ඒ වැඩේ කොහොම හරි කරපල්ලා යනුවෙනි. එවිට මා කීවේ නෑ ඔයා ඉදිවි, අපි සරසවි සම්මාන උලෙල කරන්නට ඕන තැනට වැඩේ ලෑස්ති කරගමු කියාය.

මහා මැතිවරණයට පෙර එජාපයට කලාකරුවන් රැස්කර ගැනීම ගැන අමුතුවෙන් කිව යුතුව නැත. ඒ වන විටත් තිබූ දැඩි දෙගිඩියාව හා අවිනිශ්වාදය මත ධයනා ගමගේ ඇතුලු අප පිරිස විසින් කෙසේ හෝ 1500 පිරිසක් කොළඹට ගෙන්වා ගත්තේය. අගමැතිතුමාට භාර දුන් යෝජනා 10 අතරේ ප්‍රධාන කරුණක් වූයේ මෙම සම්මාන උලෙලවල් දෙකය. දැනට එය සඵල වී තිබීම ඇත්තටම සතුටකි.

ජනාධිපති සම්මාන උලෙල ගැන මා නිතර නිතර සංස්ථාවේ සභාපතිතුමාට වද දෙමින් සිටින්නේ එය මා කියන නිසා කරන බව හැගවීමට නොව ඒ ගැන අපගේ ඇති දැන් උනන්දුව නිසාය. බරපතල දේශපාලනික මැදිහත් වීම් මත ගරා වැටුන ශ්‍රී ලංකාවේ සිනමාව හා රූපවාහිනිය ගොඩගත හැකි වන්නේ එවැනිම දේශපාලනික මැදිහත්වීමකින් බව මා තරයේ විශ්වාස කරමි. ඒ මේ රටේ ජනාධිපතිවරයා හා අග්‍රාමාත්‍යවරයාගෙන් ඉටුකරගත හැකිවනු ඇතැයි ද බරපතල විශ්වාසයක් පවතී.

නැවත වරක් රටේ ප්‍රධාන සිනමා සම්මාන උලෙලක ආඩම්බරය රටේ සිනමා කලාකරුවන්ට රසවිඳීමේ මහගු අවස්ථාව උදාවේවා යන සුභවාදී ප්‍රාර්ථනය අපි තුල නිරන්තරයෙන්ම ඇති බව සඳහන් කරමි.

# ජාත්‍යන්තර සිනමා සිහිනය සැබෑ කරගත් අපේ චන්ද්‍රන් රත්නම්




**දමිළ පියෙකුට දාව සිංහල මවකගේ කුසින් මෙලොව එළිය දුටු, දරුවන් අට දෙනෙකුගෙන් යුත් පවුලේ ඔහු තුන්වැන්නා විය. සිය පියාගේත් මවගේත් ආදරණීය ජීවිතය දෙස ඔහු නිරතුරුව හෙළුවේ ගෞරවාන්විත බැල්මකි. සිය මව් පිය දෙපළගේ ආදර කතාව චිත්‍රපට තිර කතාවකට ගෙන එන්නට මේ පුතාට සිතුණි.**

'ආදර කතාව' ඒ චිත්‍රපටයයි. සැබැවින්ම එය එකල ජනප්‍රිය චිත්‍රපටයක් විය. චන්ද්‍රන්ගේ පියා තම පුතුගේ සිනමා සම්ප්‍රාප්තිය පිළිබඳව සතුටු වුවද ඔහුට අවැසි වූයේ තම පුතු වෛද්‍යවරයෙකු, නීතීඥවරයෙකු හෝ සිවිල් සේවකයෙකු වනු දැකීමටයි. එහෙත් චන්ද්‍රන් රත්නම්ගේ දෛවය වෙනස් කරන්නට කිසිවෙකුට නොහැකි විණි. කාලයාගේ ඇවෑමෙන් හොලිවුඩ්පුරයට ගිය චන්ද්‍රන් රත්නම්ට එකී තැනෙක චිත්‍රපට සමග එක්ව වැඩ කරන්නට වරම් ලැබුනි.

ස්ටීල්බර්ග්, හිච්කොක් වැනි හොල්වුඩ් සිනමාවේ දැවැන්තයින් හා සම්බන්ධ වන්නට තරම් චන්ද්‍රන් රත්නම් වාසනාවන්ත විය. අවුරුදු 30කට වඩා වැඩි කාලයක් හොලිවුඩ්පුරයේ හිඳිමින් ලැබූ අත්දැකීම් ගොන්න අසීමිතය.

චන්ද්‍රන් රත්නම් නම් වූ සිනමාවේදියාගේ සිනමා ආගමනය පටන් ගත්තේ එතැනිනි. පෞද්ගලික ජීවිතයේදී ඔහු අත් විඳි තම මාපියන්ගේ අපූරු සෙනෙහස තිර නාටකය තුළදී යම් වෙනස්කම් වලටද පත් කළේය. රෝමියෝ ජුලියට් ට්‍රැජඩි කතාවේ අවසානය ඔහු සිය කුලුදුල් තිර නාටකයට එක් කළේය. තිරකතාව ලියා වසර 15කට පසු එය චිත්‍රපටයකට නැගීමට ඔහු දුටු සිහිනය සැබෑ විය.

*'මං තාමත් සිනමාව ගැන ඉගෙන ගන්නවා.'* ඔහුගේ මුවින් පිටවන නිරහංකාරම වචනය එයයි. සියල්ල දත් බහුතරය වෙසෙන ක්ෂේත්‍රයේ අත්දැකීම්වලින් පරිනතව සිටින ඔහු තුළ ඇති සංවේදී බව ඒ වචන තුළ ගැබ් වී තිබුණි.

තාක්ෂණික අවබෝධයෙන් පරතෙරට ගියද මානුෂීය අවබෝධයක් ඒ හා සංවේදීව ඇසුරු කරන්නට බැරි නම් සාර්ථක අධ්‍යක්ෂකවරයෙකු වන්නට නොහැකි බව චන්ද්‍රන් අදහන ධර්මතාවයයි.

අන්තර්ජාලය පරිහරනය කරමින් සිනමාවේ දක්ෂතා මවන්නට නොහැක. දැනුමෙන් පෝෂණය වුවද, අන්තර්ජාලීය දැනුමෙන් සාර්ථක චිත්‍රපට අධ්‍යක්ෂකවරයෙකු වන්නට නොහැකි වග ඔහු දැඩිව විශ්වාස කරයි.



ආදර කතාව, ජනේලය, පොරොන්දුව වැනි චිත්‍රපට නිපද වූ චන්ද්‍රන් රත්නම්ගේ සුවිශේෂි සළකුණ 'අලිමංකඩ' විය. නිහාල් ද සිල්වාගේ කෘතියක් ඇසුරින් අලිමංකඩ බිහිවුණි.

ඒ ඇසුරින් ඔහු චිත්‍රපට නිර්මාණය කලේය. මනෝහාන් නානායක්කාර මහතා චන්ද්‍රන්ගේ සිනමා ජීවිතයේ ඉතාම සුවිශේෂී චරිතයකි. අලිමංකඩ චිත්‍රපටයේ දමිළ අයිතියටත් මනෝහාන් නානායක්කාර මහතා එම චිත්‍රපටය ලෝ පුරා පෙන්වීමට කටයුතු කළේය. එය නිව්යෝර්ක් ෆිල්ම් ෆෙස්ටිවල් සඳහාද තේරුණි.

හොලිවුඩ් සුපිරි තරුවක වන බෙන් කිංස්ලි අධ්‍යක්ෂණය කරන්නට තරම් චන්ද්‍රන් වාසනාවන්තයෙකු වන්නේ 'අ කොමන් මෑන් ' චිත්‍රපටය තුළිනි. මේ වන විට ජාත්‍යන්තර සම්මාන බොහොමයක් ලැබූ 'අ කොමන් මෑන්' චිත්‍රපටය චන්ද්‍රන්ට අධ්‍යක්ෂණය කරන්නට වරම් ලැබෙන්නේ මනෝහාන් නානායක්කාර මහතා නිසාය. එම චිත්‍රපටය නිසා චන්ද්‍රන් රත්නම් ජාත්‍යන්තර සිනමාව තුළ දැඩි කතාබහට ලක් වූ පුද්ගලයෙකි.

අපේ සිනමාවේදියෙකු ජාත්‍යන්තරය ස්පර්ශ කිරීමේ ආඩම්බරය හිමිවන්නේ මුළු මහත් ශ්‍රී ලංකාවටමය. ජාත්‍යන්තර හීන සැබෑ කරගන්නා චන්ද්‍රන් රත්නම් නම් වූ නිර්මාණවේදියාට ශ්‍රී ලාංකීය සිනමාවටද සොඳුරු නිර්මාණ බිහි කරන්නට වරම් ලැබේවා යන්න අපේ ප්‍රාර්ථනයයි.

බුද්ධිනී ජයවර්ධන